# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 81— 1973 ඔක්තෝබර් 12 වැනි සිකුරාදා — 1973.10.12

( ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී )

# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටු | | පිටු |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | ... 203 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... | ... — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... | ... 205 | විවිධ දැන්වීම් ... ... ... | ... — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... | ... — | | |



සැලකිය යුතුයි.—(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 39 දරණ විනිමය පාලන (සංශෝධන) පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 40 දරණ දුම්කොළ බදු (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 41 දරන ණය සහනදායක (සංශෝධන) පනත සහ විසර්ජන පනත් 1973 ඔක්තෝබර් 12 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

කෙටුම්පත (ii) කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 1973 ඔක්තෝබර් 05 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළඳ ලකුණුවලට අදල සියළුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරී දිනකම පෙරවරු නවයේ සිට පස්වරු තුන දක්වාද, සෑම වරුවේ දිනවල පෙරවරු නවයේ සිට පෙරවරු එකොළහයි තිහ දක්වා ද, ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරි දිනවල පස්වරු දෙක දක්වා ද, වරුවේ දිනවල පෙරවරු එකොළහ දක්වා ද , භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම්

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළඳ ලකුණු, ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

### ''ඒ'' කොටසේ හෝ ''බී'' කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ '' ඒ '' කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලයීය අංකය සමඟ දක්වනු ලැබේ. රෙජිස්ටරයේ '' බී '' කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් '' බී '' අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරයෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

203—බී 71049—9,226 (73/10)

01

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළතදී රුපියල් 25ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග ටී. ඇම්. 7 දරන ෆෝර්ම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම් අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම් කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන් ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

---

(1) වෙළඳ ලකුණේ අංකය: 33,705. (2) ලැබුණ දිනය: 1971 ජූලි මස 14 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): මට්සුෂිටා ඊලෙක්ට්‍රික් ඉන්ඩස්ට්‍රියල් කො. ලිමිටඩ් (ජපානයේ නීති යටතේ සංවිධානයව පවත්වාගෙන යනු ලබන සමාගමකි) ඔසාකා කඩෝමාගි අංක 1006 දරණ ස්ථානයේ එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටි, කඩෝමා—ෂි ඔසාකා ප්‍රිෆෙක්චර්. ජපානය නිෂ්පාදකයෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රිසී මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 39. (6) බඩු: කඩදාසි තිර හැර, ලිපි ද්‍රව්‍ය සහ පොත් බැඳුම්. (7) වෙළඳ ලකුණේ සටහන:

PANA

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ජනවාරි මස 27 වන දින.

10–376/1—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 34,275. (2) ලැබුණ දිනය: 1972 අප්‍රේල් මස 21 වන දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ෆැබර්ජ් ඉන්කෝර්පරේටඩ් (ඩිලවෙයාර් රාජ්‍යයේ නීති යටතේ සංවිධානයව පවත්වාගෙන යනු ලබන සංස්ථාවකි) අංක 1345, ඇවනිව් ඔෆ් ද ඇමරිකාස්, නිව්යෝර්ක්, නිව්යෝර්, ඇමරිකා එක්සත් ජනපදය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රිසී මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 48. (6) බඩු: සියල්ලම 48 වන පංතියට අයත්වන සුවඳ සබන්, සුවඳ ද්‍රව්‍ය, වාෂ්පශීල තෙල් වර්ග, ශිෂ්ඨාලේප ප්‍රසාධන සම්මිශ්‍රණ, දන්තාලේප. (7) වෙළඳ ලකුණේ සටහන:

KIKU

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ජනවාරි මස 27 වන දින.

10–366/2—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 34,643. (2) ලැබුණ දිනය: 1972 ජූලි මස 24 වන දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): නිපොන් ටෝකි කබුෂිකි කයිෂා (නොරිටේක් කො ලිමිටඩ්) (ජපානයේ නීති යටතේ සංවිධානය වූ සංස්ථාවකි) අංක 1, 1-චෝම්, නො වේක්-ෂින්මැචි, නිෂි-කු, නාගෝයා, ජපානය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇතත්ම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රිසී මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 16. (6) බඩු: පීගන් මැටි වලින් නිපැයුණු මේස බඩු, ඇතිලි, කළ, පිසීම පිණිස භාවිතා කෙරෙණ බඳුන් සහ මුළුතැන්ගෙයි භාවිතාකෙරෙණ සෙසු බඳුන් සහ මැටි බඳුන්. (7) වෙළඳ ලකුණේ සටහන:

Noritake

මෙම වෙළඳ ලකුණ අංක 19,629 දරණ වෙළඳ ලකුණ හා ආශ්‍රිත කරණු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 ඔක්තෝබර් 24 වන දින.

10–376/3—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 34,734. (2) ලැබුණ දිනය: 1972 සැප්තැම්බර් මස 28 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): නෝබල්ස් එක්ස්ප්ලෝසිව් කම්පනි ලිමිටඩ් (ස්කොට්ලන්තයේ නීති යටතේ සංවිධානයව පවත්වාගෙන යනු ලබන සමාගමකි) නෝබල් හවුස්, ස්ටිවන්ස්ටන්, අයර්ෂයර්, ස්කොට්ලන්තය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රිසී මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 20. (6) බඩු: පුපුරණ ද්‍රව්‍ය, පුස්ඵෝටක සහ සේව සේව නූල්. (7) වෙළඳ ලකුණේ සටහන:

NETEX

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 පෙබරවාරි මස 28 වන දින.

10–376/4—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 32,436. (2) ලැබුණ දිනය: 1970 මාර්තු මස 5 වන දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): දිවාෆ්‍රාම ලිමිටඩ් (ස්විට්සර්ලන්තයේ නීති යටතේ සංස්ථාපිත සමාගමකි) තැ. පෙ. 242, 8037 සූරිච්, ස්විට්සර්ලන්තය; නිෂ්පාදකයෝ සහ බෙදාහරින්නෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජෝන් විල්සන් මයා. අංක 365 වේල්ල වීදිය, කොළඹ 12. (5) පන්තිය: 48. (6) බඩු: අංගරාග, ප්‍රසාධන නිෂ්පාදන සහ සුවඳ විලවුන්. (7) වෙළඳ ලකුණේ සටහන:

DIVA

මෙම වෙළඳ ලකුණ පළකරණු ලබන ගැසට් පත්‍රයේ එම නිවේදනයේ පිටපතක් නම් කරන ලද අංක 28,224 දරණ වෙළඳ ලකුණ අයිතිකරුවන් වෙත භාරදීමේ කොන්දේසියට යටත්ව එය පිළිගන්නා ලදී.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 මාර්තු මස 8 වන දින.

10–378—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

(1) වෙළඳ ලකුණේ අංකය: 28,467. (2) ලැබුණ දිනය: 1966 නොවැම්බර් මස 12 වන දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): සෙන්ට් ඇන්තනීස් හාඩ්වෙයාර් ස්ටෝර්ස් ලිමිටඩ් සහ අරුලානන්තම් යෙසුවඩියන් සැමුවෙල් ඥණම් (සෙන්ට් ඇන්තනීස් ජිග් ඇන්ඩ් ටූල් එන්ජිනියර්ස් යනුවෙන් ව්‍යාපාරික) අංක 516, දකුණු ස්කිනර් පාර, කොළඹ; නිෂ්පාදකයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජෝන් විල්සන් මයා, පෙරකදෝරු සහ නොතාරිස් තැන, අංක 365, වෙල්ල වීදිය, කොළඹ 12. (5) පන්තිය: 12. (6) බඩු: ඉස්කුරුප්පු කැට, ඉස්කුරුප්පු කැපීමේ දාර සහිත ආයුධ, සවිකරමල් සහ පිඩ (සියල්ලම දාර සහිත ආයුධ). (7) වෙළඳ ලකුණේ සටහන:

ANTON

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 අගෝස්තු මස 29 වන දින.

10–379—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 34,163. (2) ලැබුණ දිනය: 1972 පෙබරවාරි මස 9 වන දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): මෝල්ටන් ඩිවලොප්මන්ට්ස් ලිමිටඩ් (මහ බ්‍රිතාන්‍යයේ නීති යටතේ විධිමත්ව සංස්ථාපිත ඒකාබද්ධ මණ්ඩලයක්) ද හෝල්, බ්‍රැඩ්ෆර්ඩ්-ඔන්-ඇවොන් විල්ට්ෂයර්, එංගලන්තය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහිවූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජුලියස් සහ ක්‍රීසි මහතුන් තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 13. (6) බඩු: සියල්ලම වාහන සඳහා වන, දුනු සහ අවලම්බන පද්ධති සහ යථෝක්ත සියලුම භාණ්ඩ කොටස්. (7) වෙළඳ ලකුණේ සටහන:

HYDRAGAS

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 පෙබරවාරි මස 5 වන දින.

19–375/1—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 33,540. (2) ලැබුණ දිනය: 1971 මැයි මස 15 වන දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): එෆ්. හොෆ්මන්-ලා රෝච් ඇන්ඩ් කො. ලිමිටඩ් කම්පනි (ස්විට්සර්ලන්ත සමාගමකි) බාල්, ස්විට්සර්ලන්තය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජුලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 8. (6) බඩු: චිත්‍රපට කඩ, චිත්‍ර තාච, ශ්‍රව්‍ය සහ දෘෂ්ටි පටි. (7) වෙළඳ ලකුණේ සටහන:

ROCOM

මෙම වෙළඳ ලකුණ අංක 33,097 දරණ වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබුවහොත් හෝ ලැබූවිට එම ලකුණ හා සමග ආශ්‍රිත කරනු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 පෙබරවාරි මස 3 වන දින.

10–375/2—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 32,155. (2) ලැබුණ දිනය: 1969 නොවැම්බර් මස 26 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): සීබා ලිමිටඩ් (ස්විට්සර්ලන්තයේ නීති යටතේ සංවිධානය වූ බද්ධ ව්‍යාපාර වස්තු සමාගමකි) ක්ලිබෙක්ස්ට්‍රාසී, 141, බාල්, ස්විට්සර්ලන්තය; රසායන ද්‍රව්‍ය නිෂ්පාදකයෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජුලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 1. (6) බඩු: රෙදි සම්, කඩදාසි සහ ප්ලාස්ටික් කර්මාන්තවල භාවිතා වන රසායනික නිෂ්පාදන, ප්‍රකාශ විරංජක. (7) වෙළඳ ලකුණේ සටහන:

UVITEX

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
1973 ජනවාරි මස 20 වන දින,
කොළඹ.

10–375/3—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 33,097. (2) ලැබුණ දිනය: 1970 ඔක්තෝබර් මස 12 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): එෆ්. හොෆ්මන්-ලා රෝච් ඇන්ඩ් කෝ. ලිමිටඩ් කම්පනි (ස්විට්සර්ලන්තයේ නීති යටතේ සංවිධානය වූ සමාගමකි) බාල්, ස්විට්සර්ලන්තය; නිෂ්පාදකයෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජුලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 8. (6) බඩු: මෙවලම් සහ උපකරණ ඇතුළුව ඉගැන්වීමේ සහ උපදේශ භාණ්ඩ. (7) වෙළඳ ලකුණේ සටහන:

ROCOM

මෙම වෙළඳ ලකුණ අංක 33,540 දරණ වෙළඳ ලකුණ හා ආශ්‍රිත කරනු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ජනවාරි මස 26 වන දින.

10–375/4—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන

### ශුද්ධියකි

අංක 62 හා 1973 ජූනි මස 1 වැනි දින දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 29 වන පන්තියේ "SINGAPORE AIRLINES and WING DEVICE", දරණ වෙළඳ ලකුණ සම්බන්ධ 1973 ජනවාරි මස 8 වැනි දින නිවේදනයේ (1 )වන විෂය (වෙළඳ ලකුණේ අංකය) 34,907 නොව 34,906 සේ කියැවෙන අයුරු නිදොස් විය යුතුය.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ජූනි මස 18 වැනි දින,

10–479—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

### ශුද්ධියකි

අංක 62 හා 1973 ක්වූ ජූනි මස 1 වැනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 23 වන පන්තියේ "SINGAPORE AIRLINES and WING DEVICE". දරණ වෙළඳ ලකුණ සම්බන්ධ 1973 ජනවාරි මස 8 වැනි දින නිවේදනයේ (1) වන විෂය (වෙළඳ ලකුණේ අංකය) 34,908 නොව 34,912 සේ කියවෙන අයුරු නිදොස් විය යුතුය.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1973 ජූනි මස 18 වැනි දින.

10–477—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

### ශුද්ධියකි

අංක 62 හා 1973 ජූනි මස 1 වැනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 27 වන පන්තියේ "SINGAPORE AIRLINES and WING DEVICE" දරණ වෙළඳ ලකුණ සම්බන්ධ 1973 ජනවාරි මස 8 වැනි දින නිවේදනයේ (1) වන විෂය (වෙළඳ ලකුණේ අංකය) 34,906 නොව 34,908 සේ කියැවෙන අයුරු නිදොස් විය යුතුය.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1, 1973 ජූනි මස 18 වැනි දින,

10–478—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

සැ. යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඔක්තෝබර් | ... | 5.10.73 | සිකුරාද | ... | 28. 9.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 12.10.73 | සිකුරාද | ... | 5.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 19.10.73 | සිකුරාද | ... | 12.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 26.10.73 | සිකුරාද | ... | 19.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| නොවැම්බර් | ... | 2.11.73 | සිකුරාද | ... | 26.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 9.11.73 | සිකුරාද | ... | 2.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 16.11.73 | සිකුරාද | ... | 9.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 23.11.73 | සිකුරාද | ... | 16.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 30.11.73 | සිකුරාද | ... | 23.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| දෙසැම්බර් | ... | 7.12.73 | සිකුරාද | ... | 30.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 14.12.73 | සිකුරාද | ... | 7.12.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 21.12.73 | සිකුරාද | ... | 14.12.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 28.12.73 | සිකුරාද | ... | 21.12.73 | සිකුරාද | දහවල් | 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.